සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල


හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 10 | ඉතිහාසය | 1 | 1. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍ර |



සැකසුම: රනිල් ජයසිංහ

පලන්නොරුව මධ්‍ය මහා විද්‍යාලය



# මූලාශ්‍ර වර්ගීකරණය

## 1. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය බෙදනු ලබන ප්‍රධාන වර්ග

**1.** සාහිත්‍ය මූලාශ්‍රය

I. දේශීය සාහිත්‍ය මූලාශ්‍රය

**II.** විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය

**2.** පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

# 1.1 අනුරාධපුර රාජධානි යුගයේදී රචනා වූ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය

i. දීපවංසය

ii. මහාවංසය

iii. වංසත්ථප්පකාසිනිය

# 1.1.1 දීපවංසය පිළිබඳ විශේෂ කරුණු

1. දැනට භාවිතයේ ඇති පැරණිතම දේශීය සාහිත්‍ය මූලාශ්‍රය වීම.

2. ක්‍රි. ව හතරවන සියවසේ දී පමණ රචනා වී තිබීම.

3. ගෞතම බුදුන්ගේ ප්‍රථම ලංකා ගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා මෙරට ඓතිහාසික පුවත් හා ශාසන ඉතිහාසය සම්බන්ධ පුවත් ලියවී තිබීම.

4. * පුනරුක්ති දෝෂ දක්නට ලැබීම.
   * ඇතැම් ඓතිහාසික පුවත් කෙටියෙන් ලියා තැබීම වැනි අඩුපාඩු දක්නට ලැබීම.

# 1.1.2 මහාවංසය පිළිබඳ විශේෂ කරුණු

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව රචනා වී තිබීම.

2. මහාවංසයෙහි සඳහන් තොරතුරු බොහෝමයක් ශිලා ලිපි හා වෙනත් මූලාශ්‍ර මගින් සනාථ වී තිබීම.

3. ක්‍රි. ව පස්වන හෝ හයවන සියවසේ දී රචනා වී තිබීම.

4. මහාවංසයේ මුල් කොටස අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙන් වාසී මහානාම හිමියන් විසින් රචනා කර තිබීම

5. මහාවංසයෙහි හා දීපවංසයෙහි සමතාවක් දක්නට තිබීම.

6. බුදුන්ගේ ප්‍රථම ලංකා ගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා ඓතිහාසික තොරතුරු මහාවංසයේ මුල් කොටසට ඇතුලත් වීම.

7. මහාවංසයේ මුල් කොටස රචනා කිරීම සඳහා ඉන් පෙර රචනා කර තිබූ කෘතීන් වල තොරතුරු ද පාදක කොටගෙන තිබීම.

i. සීහලට්ඨ කතා මහාවංසය. (ප්‍රධාන පාදක ග්‍රන්ථය)
ii. උත්තර විහාරට්ඨ කතා.
iii. විනයට්ඨ කතා.
iv. දීපවංසය.

# 1.1.3.
# රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීම සඳහා උපකාරී වන ධර්ම ග්‍රන්ථ

i. බෝධිවංසය - පොළොන්නරු යුගයේ රචනා වී ඇත.

ii. ථූපවංසය - පොළොන්නරු යුගයේ රචනා වී ඇත.

iii. ධාතුවංසය - පොළොන්නරු යුගයේ රචනා වී ඇත.

iv. පූජාවලිය - දඹදෙණි යුගයේ රචනා වී ඇත.

v. සද්ධර්මරත්නාවලිය - ගම්පොළ යුගයේ රචනා වී ඇත.

# 1.1.4

# ගම්පොළ රාජධානි යුගයේ සිට කෝට්ටේ රාජධානි යුගය දක්වා ඉතිහාසය හැදෑරීමට උපකාරී වන දේශීය සාහිත්‍ය මූලාශ්‍ර

i. නිකාය සංග්‍රහය - මෙරට ශාසන ඉතිහාසය පිළිබඳව ලියවී ඇත.

ii. රාජාවලිය - මෙරට දේශපාලන ඉතිහාසය පිළිබඳව ලියවී ඇත.

# 1.1.5
# කෝට්ටේ රාජ්‍ය සමයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමට උපකාරී වන කාව්‍ය ග්‍රන්ථ

- i. සංදේශ කාව්‍ය
  - මයූර සංදේශ - ගම්පොළ යුගය - ප්‍රථම සංදේශ කාව්‍ය
  - තිසර සංදේශ - ගම්පොළ යුගය
  - සැළලිහිණි සංදේශ - ගම්පොළ යුගය
- ii. හටන් කාව්‍ය
  - සීතාවක රාජසිංහ
  - කොන්ස්තන්තිනූ හටන
  - ඉංග්‍රීසි හටන
- iii. ප්‍රශස්ති කාව්‍ය
  - පැරකුම්බා සිරිත - කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා

# 1.1.6

## ඉතිහාසය ගොඩ නගා ගැනීමට

## සාහිත්‍ය මූලාශ්‍රය

## යොදා ගැනීමේ දී සැළකිලිමත් විය කරුණු

i. මූලාශ්‍රය රචනා වූ කාලය

ii. මූලාශ්‍රයේ කතුවරයා

iii. කතුවරයාගේ අරමුණ

iv. කතුවරයා සිය කෘතියට තොරතුරු සපයා ගත් අයුරු

# 2. විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය

# 2.1 ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් කර රචනා වූ දකුණු ඉන්දියානු සාහිත්‍ය මූලාශ්‍රය

i. සිලප්පදිකාරම්
ii. මණිමේකලෛයි
iii. පදිර්රුපත්තු

# 2.1 ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ලියා තැබූ විදේශීය ලේඛකයින් අයත් වන කාණ්ඩ දෙක

i. ශ්‍රී ලංකාවට පැමිණි කතුවරුන්
ii. ශ්‍රී ලංකාවට නොපැමිණි කතුවරුන්

# 2.3 ශ්‍රී ලංකාවට පැමිණි කතුවරුන්ගේ රටවල්, ඔවුන්ගේ නම් සහ කෘතීන්

i. චීනය - පාහියං හිමි (බෞද්ධ රාජධානි පිළිබඳ විස්තර)

ii. අරාබිය - දේශ ගවේශක ඉබන් බතූතා (දේශාටන වාර්තා)

iii. පෘතුගාලය - හමුදා නිලධාරී රිබෙයිරෝ (රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය) (පෘතුගීසි)

iv. ඕලන්දය - දේවගැති පිලිප්පස් බැල්ඩියස් (බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය) (ලන්දේසිය)

v. එංගලන්තය - සිරකරුවකු වූ රොබට් නොක්ස් (එදා හෙළදිව) (ඉංග්‍රීසි)

# 2.4 ශ්‍රී ලංකාවට නොපැමිණි කතුවරුන්ගේ රටවල්, ඔවුන්ගේ නම් සහ කෘතීන්

i. ග්‍රීසිය

(ග්‍රීක ජාතිකයින්)

- ඇරිස්ටෝටල් - ඩිමුන්ඩෝ
- මෙගෙස්තිනීස් - ඉන්ඩිකා
- ඔනෙසික්‍රිටස් - වෙළඳ වර්තා

ii. රෝමය

(රෝමානුවන්)

- ක්ලෝඩියස් ටොලමි - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය
- මෙගෙස්තිනීස් - ඉන්ඩිකා

iii. චීනය

- හියුං සියැන් හිමි - දේශාටන වාර්තා

iv. පෘතුගාලය

- පර්නාම් ඩී ක්වේරෝස් පියතුමා - ලංකාධිපත්‍ය

## 2.5 විදේශීය කතුවරුන් අතරින් ලංකාව පිළිබඳ ප්‍රමුඛත්වයක් ලබා දෙමින් තොරතුරු ලියා තැබූ කතුවරුන් හා ඔවුන්ගේ කෘතීන්

i. ජුආඕ රිබෙයිරෝ - රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය

ii. පිලිප්පස් බැල්ඩියස් - බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය

iii. රොබට් නොක්ස් - එදා හෙළදිව

iv. පර්නාම් ඩී ක්වේරොස් පියතුමා - ලංකාධිපත්‍ය

# 3. ඉතිහාසය හැදෑරීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර වලින් ලැබිය හැකි ප්‍රයෝජන

i. ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස් කර ගැනීමට උපකාරී වීම.

ii. සාහිත්‍ය මූලාශ්‍රයේ විස්තර වන කාල වකවානුවේ දේශපාලන , ආර්ථික, සමාජ හා සංස්කෘතික ආදී අංශ පිළිබඳව තොරතුරු ලබා ගැනීමට උපකාරී වීම.

iii. එක් මූලාශ්‍රයක් මඟින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මඟින් සනාථ කර ගැනීමට උපකාරී වීම.

iii. රටක විදේශ සම්බන්ධතා අධ්‍යයනය කිරීමට උපකාරී වීම.

# පුරාවිද්‍යා මූලාශ්‍රය

## 01. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ගයට අයත් මූලාශ්‍ර කාණ්ඩ

- අභිලේඛන
- කාසි ( නාණක මූලාශ්‍රය)
- නටබුන්
- චිත්‍ර , මූර්ති හා පුරාවස්තු

# ♣ අභිලේඛන

# 02. අභිලේඛන යනු ,

- සාහිත්‍ය මූලාශ්‍රය නොවන අනෙකුත් සියළුම පැරණි ලේඛන හැඳින්වීම සඳහා යොදා ගන්නා ලද පොදු හැඳින්වීමයි.

# 03. අභිලේඛන වලට අයත් මූලාශ්‍රයන්

- ගල් මත ලියන ලද ලිපි - සෙල්ලිපි / ශිලා ලිපි ශිලා ලේඛන
- බිත්ති මත ලියන ලද ලිපි - බිත්ති ලිපි
- ලෝහ තහඩු මත ලියන ලද ලිපි - සන්නස්
- දැව මත ලියන ලද ලිපි
- විවිධ භාජන ආදියෙහි ලියන ඇති ලිපි

# 04.

# සෙල්ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව බෙදා දැක්විය හැකි සෙල්ලිපි වර්ග

- ලෙන් ලිපි - භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීමේ දී ගල් ලෙනෙහි කටාරමට පහළින් කොටන ලද ලිපි

- ගිරි ලිපි (පර්වත ලිපි) - ගල ස්වභාවික ස්වරූපයෙන් තිබිය දීම එය මත ලියන ලද ලිපි

- පුවරු ලිපි - ගලක් , පුවරුවක් ආකාරයෙන් සකස් කරගෙන එය මත ලියන ලද ලිපි

- ටැම් ලිපි - ගලක් , කණුවක් හෙවත් ටැඹක් ආකාරයෙන් සකස් කරගෙන එය මත ලියන ලද ලිපි

- ආසන ලිපි - ගලින් සකස් කර ගත් මල් ආසන මත ආදිය ලියන ලද ලිපි

# 05. සෙල්ලිපි දැක ගත හැකි ස්ථාන

- මිහින්තලය
- සිතුල්පව්ව
- රජගල
- රිටිගල
- සීගිරිය
- වෙස්සගිරිය

# 06.

# මෙරටින් හමු වී ඇති පැරණිතම සෙල්ලිපි වර්ගය

- ලෙන්ලිපි (බ්‍රාහ්මීය ලිපි යනුවෙන් ද හැඳින් වේ)
  - පැරණිතම ලෙන්ලිපි ලිය වූ වර්ෂය - ක්‍රි . පූ තුන්වන සියවස
  - භාෂාව - සිංහල ප්‍රාකෘත භාෂාව
  - අක්ෂර වර්ගය - බ්‍රාහ්මීය අක්ෂර

# 07. සෙල්ලිපි මඟින් වාර්තා කර තැබූ කරුණු

- භික්ෂූන්ට ලෙන් පූජා කළ පුද්ගලයින් පිළිබඳ තොරතුරු
- විහාර අරාමවලට ගම්බිම් පූජා කිරීම් තොරතුරු
- රජයට සේවය කළ පුද්ගලයින්ගේ සේවය අගය කිරීම
- වැරදිකරුවන්ට සමාව දීම - දැදිගම අභය දාන පුවරු ලිපිය - 6 වන බුවනෙකබාහු රජු

- රජය විසින් පනවනු ලබන නීතිරීති
  - ➢ විහාර ආරාම පාලනයට සම්බන්ධ නීතිරීති - මිහින්තලා පුවරු ලිපිය
  - ➢ අපරාධ නීති - වේවැල්කැටිය ශිලා ලේඛනය - 4 වන මහින්ද රජු
  - ➢ වෙළඳාම සම්බන්ධ නීති - බදු¨ ටැම් ලිපිය - 3 වන උදය රජු
  - ➢ බදු සම්බන්ධ නීති
  - ➢ පරිසර සංරක්ෂණ නීති - කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය
  - ➢ කෘෂිකර්මය සම්බන්ධ නීති - වෙස්සගිරි සෙල්ලිපිය - 4 වන මිහිඳු රජු

# 08.

# ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ දී සෙල්ලිපි වලින් ලැබෙන ප්‍රයෝජන

- ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
- පැරණි සමාජ ඉතිහාසය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
- සාහිත්‍ය මූලාශ්‍රය සඳහන් තොරතුරු සත්‍යභාවය තහවුරු කර ගැනීමට උපකාරී වීම.
- සාහිත්‍ය මූලාශ්‍රය වල සඳහන් නොවන තොරතුරුවල අනාවරණය කර ගැනීමට උපකාරී වීම.

# 09.

## බිත්ති මත ලියන ලද ලිපි සඳහා නිදසුන් ලෙස සඳහන් කළ හැකි සීගිරි කැටපත් පවුරේ ඇති ‘කුරුටු ගී’ පිළිබඳ විශේෂ කරුණු

- අයත් වන රාජධානි යුගය - අනුරාධපුර රාජධානි යුගය
- ලියා වී ඇති කාලසීමාව - ක්‍රි . පූ 5 වන හා 7 වන සියවස අතර
- ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන :-
    - පැරණි අක්ෂර භාවිතය හා ඒවා විකාශනය වූ ආකාරය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
    - පැරැන්නන්ගේ නිර්මාණශීලි හැකියාව පිළිබඳ දැන ගැනීමට උපකාරී වීම.
    - පැරණි සමාජ ඉතිහාසය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.

# 10.

# ලෝහ තහඩු මත ලියන ලද ලිපි සහ ඒවා පිළිබඳ විශේෂ කරුණු

- ලිවීම සඳහා යොදාගෙන ඇති ලෝහ වර්ග - රන් / තඹ
- සන්නස් සඳහා නිදසුන්

* වල්ලිපුරම් රන් සන්නස :-

1. භාවිතා කර ඇති අමුද්‍රව්‍ය - රන් ලෝහය
2. අයත් වන රාජධානි යුගය - අනුරාධපුර
3. කරවන ලද පුද්ගලයා - වසභ රජු

4. සඳහන් වන කරුණු - වසභ රජුගේ අමාත්‍යවරයෙකු වූ ඉසිගිරි විසින් යාපනයේ නාගදීපයේ පියංගුකතිස්ස නමින් ඉදි කර භික්ෂූන්ට පූජා කරන ලද බව.

5. හෙලිවන ඓතිහාසික තොරතුරු -

වසභ රජුගේ කාලයේ දී දිවයින ආස්ථාන හෙවත් දිස්ත්‍රික්ක වලට බෙදා පාලනය කළ බව / ප්‍රත්‍යන්ත ප්‍රදේශ පාලනය කිරීම සඳහා මධ්‍යම රජයේ නිලධාරීන් යොදවා සිටි බව.

* පනාකඩුව තඹ සන්නස :-

1. භාවිතා කර ඇති අමුද්‍රව්‍ය - තඹ ලෝහය
2. අයත් වන රාජධානි යුගය - පොළොන්නරුව
3. අයත් වන සියවස - ක්‍රි . ව 12 වන සියවස
4. කරවන ලද පුද්ගලයා - පළමුවන විජයබාහු රජු

5. ප්‍රධානය ලැබූ පුද්ගලයා - සින්නාරුබිම බුදල්නා හෙවත් බුද්ධරාජ සෙනෙවියා

6. සඳහන් වන කරුණු - පළමුවන විජයබාහු රජතුමාගේ කුඩා කාලයේ සිට රජවීම දක්වා තොරතුරු , බුද්ධරාජ සෙනෙවියා විසින් කරන ලද උපකාරයන් හා ඔහුට ලබා දුන් ප්‍රදානයන් පිළිබඳව.

7. මෙයින් හෙළිවන ගුණාංගය - කළගුණ සැලකීම

## 11.

දැව මත ලියන ලද ලිපි සඳහා නිදසුන් ලෙස සඳහන් කළ හැකි ඇම්බැක්කේ දේවාලයේ දැව කණු මත ලියන ලද ලිපි සම්බන්ධයෙන් විශේෂ කරුණු

- අයත් වන රාජධානි යුගය - ගම්පොළ යුගය
- කරවන ලද පුද්ගලයා - තුන්වන වික්‍රමබාහු රජු

# ♣ කාසී

## 12.

# කාසි හෙවත් නාණක මුලාශ්‍රය බෙදා දැක්විය හැකි මුලාශ්‍ර වර්ග දෙක

- දේශීය කාසි
- විදේශීය කාසි

# 13.

# ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන දේශීය කාසි

- ඇතා සහ ස්වස්ථික කාසිය - මෙරට දී නිශ්පාදන වනු ලැබූ ප්‍රථම කාසි වර්ගය
- ලක්ෂ්මි කාසිය
- 'අක' නම් රන් කාසිය
- මධ්‍ය කාලීන රන් කහවනුව
- තඹ මස්ස - පොළොන්නරු යුගයේ දී බහුල ලෙස භාවිතා වූ කාසි වර්ගයකි

අනුරාධපුර යුගයට අයත් කාසි

# 14.

# ශ්‍රී ලංකාවේ භාවිතා වූ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන විදේශීය කාසි

- හස් එවූ කහාපණ -

  i. කහාපාණ / කර්ෂාපණ /පුරාණ කාසි හෝ වරණ යන නම් වලින් ද හැඳින්වේ.

  ii. ශ්‍රී ලංකාවේ භාවිතා පැරණිතම කාසියයි.

  iii. ඉන්දියානු වෙළඳුන් විසින් මෙරටට ගෙන එන්නට ඇතැයි සැලකෙන රිදී කාසි වර්ගයකි.

- රෝම කාසි - මෙරටින් වැඩිපුරම හමු වී ඇති විදේශීය කාසි වර්ගය වන්නේ රෝම කාසිය (සොලිඩුස්)

- චීන කාසි

- අරාබි කාසි

# 15.

# මෙරටට අවශ්‍ය කාසි නිපදවීම මෙරට දීම නිපදවීම සිදුකළ බවට හමු වී ඇති පුරාවිද්‍යාත්මක සාධක

- කාසි නිපදවීම සඳහා යොදාගත් ලෝහමය අච්චු පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් සොයාගෙන තිබීම.

- ක්‍රි . පූ 250 තරම් ඈත කාලයකට අයත් මෙරට දී නිපදවනු ලැබූ කාසි පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් සොයාගෙන තිබීම.

# 16.
# ඉතිහාසය පිළිබඳ ඉගෙන ගැනීමේ දී කාසි භාවිතයෙන් ( නාණක මූලාශ්‍රය) ලැබිය හැකි ප්‍රයෝජන

- පැරණි ලෝහ තාක්ෂණය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
- පැරණි ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
- පැරණි විදේශ සම්බන්ධතා පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
- පැරණි විනිමය මාධ්‍යය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම.
- පැරණි ආගමික තත්ත්වයන් පිළිබඳ තොරතුරු අනාවරණය වීම.

(ඇතා හා ස්වස්ථික කාසිය / ලක්ෂ්මි කාසිය)

# ♣ පුරාණ නටබුන්

# 17. පුරාණ නටබුන් හැඳින්වීම සඳහා යොදාගන්නා වෙනත් හැඳින්වීම්

- පුරාවිද්‍යාත්මක ස්මාරක
- ඓතිහාසික ස්ථාන

# 18. පුරාණ නටබුන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක හා ඒවා සඳහා නිදසුන්

- ආගමික නටබුන් - විහාර ආරාම / දාගැබ් / ගල්කණු / පිළිම
- ආගමික නොවන නටබුන් - වැව් / පොකුණු / ආරක්ෂක ප්‍රාකාර / දිය අගල් / බලකොටු රජමාළිගා / රෝහල්

# 19. ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ දී පුරාණ නටබුන් භාවිතයෙන් ලැබිය හැකි ප්‍රයෝජන

- පැරැන්නන්ගේ නිර්මාණාත්මක හැකියාව පිළිබඳව දැනගැනීමට උපකාරී වීම. (සමාධි බුද්ධ ප්‍රතිමාව / අවුකන බුද්ධ ප්‍රතිමාව)

- පැරැන්නන්ගේ විස්තු විද්‍යාත්මක හැකියාව පිළිබඳව දැනගැනීමට උපකාරී වීම.

    i. ගොඩනැගිලි ඉදිකිරීමේ ශිල්පය - රුවන්වැලි මහා සෑයේ අත්තිවාරම පොළොන්නරුව පරාක්‍රමබාහු මාළිගාව / ලෝහ ප්‍රාසාදය

    ii. නගර නිර්මාණ ශිල්පය - අනුරාධපුර පැරණි නගරය / සීගිරි නගරික සැලැස්ම

    iii. උද්‍යාන ඉදිකිරීමේ ශිල්පය - අනුරාධපුර රන්මසු උයන / සීගිරිය බටහිර උද්‍යානය

- පැරැන්නන්ගේ තාක්ෂණික හැකියාව පිළිබඳව දැනගැනීමට උපකාරී වීම. (බිසෝ කොටුව / රළපනාව / ඌරා කැට ළිං / පොකුණු )

- පැරණි ජල පාලන උපක්‍රම පිළිබඳව දැනගැනීමට උපකාරී වීම. (සීගිරිය ජලමල් / සීගිරිය දළඟරාකාර කාණු පද්ධතිය / අමුණු )

- පැරණි පරිසර සංරක්ෂණ ක්‍රම පිළිබඳව දැනගැනීමට උපකාරී වීම. (පොළොන්නරුව ආලාහණ පිරිවෙන් රෝහල / පොළොන්නරු රජමාළිගා )

## ♣ චිත්‍ර මූර්ති හා පුරාවස්තු

# 20. මෙරට පැරණි චිත්‍ර අතර ප්‍රථමස්ථානයක් ලැබ ඇති ‘සීගිරි චිත්‍ර’ සම්බන්ධ විශේෂ කරුණු

- සීගිරි චිත්‍ර අයත් වන කලා සම්ප්‍රදාය :- රාජ කලා සම්ප්‍රදාය
- ඉතිහාසය හැදීරීමේ දී ලැබිය හැකි ප්‍රයෝජන :-
  - පැරණි කාන්තාවන්ගේ ඇදුම් පැළදුම් , කොණ්ඩ මෝස්තර , රූපලාවණ්‍ය කටයුතු ආදී අංශ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වීම.
  - පැරණි චිත්‍ර කලාව පිළිබඳව අධ්‍යයනය කිරීමට උපකාරී වීම.

# 21. වර්තමානයේ දී පුරාවස්තු දැකගත හැකි ස්ථාන

- කෞතුකාගාරවල
- ආගමික ස්ථානවල
- විවිධ ආයතන හෝ පුද්ගලයින් භාරයේ

# 22. ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ දී පුරාවස්තු වෙතින් ලැබිය හැකි ප්‍රයෝජන

- පැරැන්නන්ගේ විවිධ හැකියා හා කුසලතා පිළිබඳව දැනගැනීමට උපකාරී වීම.
    - ජේතවන විහාරයේ හමු වූ රන් තැල්ල
    - අභයගිරි විහාරයෙන් හමු වූ වර්ණාලේපිත උළු

- පැරණි සංස්කෘතිය පිළිබඳව දැනගැනීමට උපකාරී වීම.
    - ඉබ්බන්කටුව සුසාන භූමියෙන් හමු වූ පළළු මාලය
    - උඩරංචාමඩමින් හමු වූ කාන්තාවන්ගේ ඇස් අඳුන් ගාන ලෝහ කූර

- පැරැන්නන්ගේ ජීවන ක්‍රම පිළිබඳව දැනගැනීමට උපකාරී වීම.

  - ඉහත සාධක දෙක
  - පැරණි මැටි භාණ්ඩ
  - පැරණි කෘෂි උපකරණ
  - මැණික් සහ අර්ධ මැණික් වලින් සාදන ලද පබළු සහ මුද්‍රා

- පැරණි විද්‍යාව තාක්ෂණය පිළිබඳව දැනගැනීමට උපකාරී වීම.
    - දැදිගම ඇත් පහන්
    - ජේතවන විහාරයෙන් හමු වූ වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ල
    - අභයගිරි විහාරයෙන් හමු වූ වර්ණාලේපිත උළු
- පැරණි විදේශ සම්බන්ධතා පිළිබඳව දැනගැනීමට උපකාරී වීම.
    - ඉබ්බන්කටුව පබළු මාලය

# 23. සාහිත්‍ය මූලාශ්‍රය තුල දැකගත හැකි පොදු දුර්වලතා

- ඓතිහාසික සිදුවීමට පසුකාලීනව ලියවුණු ඒවා වීම.
- කතුවරුන්ගේ රුචි අරුචිකම් ඇතුළින් විය හැකි වීම.

# 24. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වල දැකගත හැකි පොදු සාධනීය ලක්ෂණ

- ඓතිහාසික තොරතුරු වලට සමකාලීන වීම.
- කෙටි හා නිශ්චිත තොරතුරු ඉදිරිපත් වීම.

# ♣ ඉතිහාසය ඉගෙන ගැනීමේ වැදගත්කම

# 25. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් අත්වන ප්‍රයෝජන

- පෞර්ෂත්වය වර්ධනය කර ගැන්මට උපකාරී වීම්
- අතීත අත්දැකීම් මඟින් වර්තමානය තේරුම් ගෙන අතීතය ගොඩ නගා ගැනීමට උපකාරී වීම.
- මනුෂ්‍යත්වයට ආදරය කරමින් ජාතික සමඟිය ගොඩ නගා ගැනීමට උපකාරී වීම.

- රටක ජාතික අනන්‍යතාවය හඳුනා ගැනීමට උපකාරී වීම.
- තමා ජීවත් වන සමාජය සහ ලෝකය පිළිබඳව යථාවබෝධය ලැබීමට උපකාරී වීම.
- විවිධ මත ඉවසීමට හුරුවීම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට හුරුවීම.

## ♣ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ආරක්ෂා කරගැනීම

# 26. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කරගත වීමට බලපාන හේතු

- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය රටක ජාතික අනන්‍යතාවය පිළිබිඹු කරන්නක් වීම.
- අනාගත පරම්පරාවට ජාතික උරුමයන් දැකගැනීමට උරුම කරදිය යුතුවීම.

26'

# පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයට හානි සිදුවන ආකාරය

- නොදැනුවත්කම නිසා සිදුවන විනාශය.
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වල ඇති වටිනාකම පිළිබඳ නොදැනුවත්කම.
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලට හානි සිදු කළ විට නීතියෙන් ලැබෙන දඬුවම් පිළිබඳ නොදැනුවත්කම.

- පිළිම දාගැබ් වැනි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුල වටිනා වස්තුව ඇතැයි සිතා ඒවා ලබා ගැනීමේ අරමුණින් සිදුකරන විනාශය. (නිධන් හෑරීම)

- සීඝ්‍ර නාගරීකරණය නිසා සිදු වන විනාශය. (ගොඩනැගිලි / මාර්ග ඉදිකිරීම්)

- ස්වභාවික ආපදා නිසා සිදුවන විනාශය.

- කෘෂිකාර්මික කටයුතු නිසා සිදුවන විනාශය.

# පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයට ආරක්ෂා කරගත හැකි අන්දම

- සමාජය දැනුවත් කිරීමට ක්‍රියා කිරීම.
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වල ඇති වටිනාකම පිළිබඳ දැනුවත් කිරීම.
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලට හානි සිදු කළ විට නීතියෙන් ලැබෙන දඬුවම් පිළිබඳ දැනුවත් කිරීම.

- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීමට පියවර ගැනීම.
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ට හානි සිදු කළ විට එම වැරදිකරුවන්ට නීතියෙන් ලබාදෙන දඬුවම් දැඩි කිරීම සහ ඒ හා සම්බන්ධ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
- සංවර්ධන කටයුතු කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ට හානි නොවන ආකාරයෙන් සැලසුම් කිරීම.

- පුද්ගලිකව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයට හානි කිරීමෙන් වැළකී සිටීම සහ හානි සිදු වන අවස්ථා දුටු විට පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කරගැනීමට නීතියෙන් බැඳී සිටින නිලධාරීන් හා ආයතන දැනුවත් කිරීම.

28'

# පැරණි කාලයේ දී ගල්වල කොටන ලද ප්‍රාදේශීය මායිම් සලකුණු

- ඉර හඳ රූප
- වටාපොත
- දුන්න
- ඊතලය
- හක්ගෙඩිය
- ගොන් කුරය
- ඇත් අඩිය
- විවිධ සත්ව රූප

**සවියෙන් පෙරට අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **10** | **ඉතිහාසය** | **1** | **1. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍ර - ඇගයීම** |

**සැකසුම - රනිල් ජයසිංහ**
**බප/හො/පලන්නොරුව ම. ම.වි**

(01)



i. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

ii. මේවා නිර්මාණය කර ගැනීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය කුමක්ද?

iii. මේවායෙහි ලියැවුණු කෘතීන් වර්ග දෙකකි. එය ලියා දක්වන්න.

iv. මේවායෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(02.)



I. මෙම රූප සටහනේ දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?

II. ඔහු කිනම් ජාතිකයෙක්ද?

III. ඔහු කිනම් නගරයක ජීවත් වූ අයෙක්ද?

IV. මොහු ජීවත් වූ කාල වකවානුව සඳහන් කරන්න.

V. මොහු කිනම් විෂයක් සම්බන්ධයෙන් ප්‍රවීනත්වයක් ඉසිලූ අයෙක්ද?

VI. මොහු විසින් රචනා කරන ලද කෘතිය කුමක්ද?

VII. මොහු විසින් රචනා කරන ලද කෘතියේ සඳහන් විශේෂ කරුණු දෙකක් සඳහන් කරන්න.

(03.)



1. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය කරවන ලද්දේ කවුරුන් විසින් ද?
3. මෙය කරවන ලද රාජධානිය කුමක් ද?
4.මෙය කරවන ලද සියවස කුමක්ද?
5. මෙය කරවන ලද අමුද්‍රව්‍ය කුමක් ද?
6. මෙහි ඇති විශේෂත්වය කුමක් ද?
7. මෙය කිනම් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ගයට අයත් ද?
8. ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ දී මේවායින් ලැබිය හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

04.)



1. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය කරවන ලද අමුද්‍රව්‍ය කුමක් ද?
3. ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ දී මේවා කිනම් මූලාශ්‍රය ලෙස හැඳින්වේ ද?
4. මේවා පිළිබඳව හදාරණු ලබන විෂය කුමක් ද?
5. ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ දී මේවායින් ලැබිය හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

05.) ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

06.) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කරගැනීමේ වැදගත්කම පිළිබඳ කරුණු දෙකක් ලියන්න.

07.) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කරගත හැකි ආකාරය පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**සවියෙන් පෙරට අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **10** | **ඉතිහාසය** | **1** | **1. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍ර - පිළිතුරු** |

**සැකසුම - රනිල් ජයසිංහ**
**පලන්නොරුව ම. ම.වි**

01.) I. පැරණි පුස් කොළ පොතකි

II. ශාක පත්‍ර

III. වංසකතා, අට්ඨකතා

IV. * ඓතිහාසික කාල අනුපිළිවෙළ ගොඩනගා ගැනීමට උපකාරි වීම

* රටක ඉතිහාසය අඛණ්ඩව ගොඩනගා ගැනීමට උපකාරී වීම

02.) I. ක්ලෝඩියස් ටොලමි

II. ග්‍රීක රෝමානුවෙක්

III. රෝමයේ ඇලෙක්සැන්ඩ්‍රියා නගරයේ

IV. ක්‍රි.ව. 90 සිට ක්‍රි.ව. 168 දක්වා

V. භූගෝල විද්‍යා විෂය

VI. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය

VII. *ලෝකයේ ප්‍රථම ලෝක සිතියම මෙයට ඇතුළත්ව තිබීම

* ශ්‍රී ලංකාවේ භූ පිහිටීම ප්‍රථම වරට සිතියමකට ඇතුළත්ව තිබීම.

03.) 1. ගල්පොත පුවරු ලිපිය

2. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා

3. පොළොන්නරු රාජධානි යුගය

4. ක්‍රි.ව.12 වන සියවස

5. කළුගල් පාෂාණ

6. ශ්‍රී ලංකාවේ දීර්ඝතම ශිලා ලේඛනය වීම

7. අභිලේඛන

8. * පැරණි සමාජ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමට උපකාරී වීම

* ඓතිහාසික යුගවල ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කිරීමට උපකාරී වීම

04.) 1. මධ්‍යකාලීන රන් කහවනුව

2. රන් ලෝහය

3. නාණක මූලාශ්‍රය

4. නාණක විද්‍යාව

5. * මෙරට පැරණි ලෝහ තාක්ෂණය පිළිබඳ අධ්‍යනය කිරීමට උපකාරී වීම

* මෙරට පැරණි ආර්ථිකය පිළිබඳ අධ්‍යයනය කිරීමට උපකාරී වීම

05.) ඉතිහාසය යනු අතීත මිනිස් ක්‍රියාකාරකම් හදාරනු ලබන විෂයකි. ඉතිහාසය විෂය ඉගෙන ගන්නා අයෙකුට ලැබිය හැකි ප්‍රයෝජන රැසකි.

1. පෞරුෂත්වය වර්ධනය කර ගැනිමට හැකි වීම

* ඉතිහාසය හැදෑරිය යුත්තේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් වන නිසා එය ඉගෙන ගන්නා විට නිතැතින්ම විවිධ ඉතිහාස මූලාශ්‍රය පරිහරණය කිරීමට පෙළඹෙයි.

* මෙසේ විවිධ මූලාශ්‍ර පරිහරණයේදී ඓතිහාසික සිදුවීම් පිළිබඳව විවිධ කරුණු අදහස් හා මතවාද හමුවන අතර ඒවා තුලින් නිවැරදි කරුණ මතු කර ගැනීමට උත්සාහ කිරීම තුළින් විචාර බුද්ධිය දියුණු වේ.

* විචාර බුද්ධිය දියුණුවීම නිසා සෑම දෙයක් පිළිබඳව තර්කානුකූලව සිතා බලා එමඟින් තමන් වෙත එළඹෙන ගැටළු නිසි පරිදි විසඳා ගැනීමේ හැකියාව ලබයි.

* ඉතිහාසය ඉගෙන ගැනීමට යාමේදී ඔහු විසින් ලබන මෙම හැකියාව තමන්ගේ පුද්ගලික ජීවිතයටද ආදේශ කර ගනු ලබයි. එය පෞරුෂත්වය වර්ධනයට හේතු වේ.

2. සමාජය තුළ යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීමට හැකියාව ලැබීම.

* වත්මන් සමාජය තුළ යහපත් පුරවැසියෙකු ලෙස ජීවත්වීම සඳහා තමන් ජීවත් වන සමාජය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍යය.

* ඉතිහාසය පාඩම් ආශ්‍රයෙන් තමන් ජීවත්වන සමාජය, රට සහ ලෝකය පිළිබඳව ඉගෙන ගැනීමට ඉතිහාසය ඉගෙන ගන්නා ශිෂ්‍යා හට අවස්ථාව හිමි වේ.

* එබැවින් ඉතිහාසය බලෙන ගන්නා පුද්ගලයා සමාජය තුළ යහපත්ව වාසය කිරීමේ උදා කරගත් අයෙකු ලෙස හැඳින්වීමට පුළුවන.

3. අන්‍ය සංස්කෘතිය ගරු කිරීමට හුරුවීම

* ඉතිහාසය ඉගෙන ගැනීමේදී විවිධ සංස්කෘතීන් පිළිබඳව ඉගෙන ගැනීමට අවස්ථාව ලැබේ. ඉතා දීර්ඝ කාලයක සිට බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආදී විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව මෙරට සමගියෙන් වාසය කළ බව ඉගෙන ගැනීමට අවස්ථාව ලැබීම.

06.) * රටක ජාතික අනන්‍යතාවය පිළිඹිබු කරන්නාක් වීම.

* රටක ජාතික උරුමයක් අනාගත පරපුරට දැක බලා ගැනීම සඳහා උරුම කර දිය යුතු වීම.

07.) 1. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වල වටිනාකම, ඒවා රැක ගැනීමේ වැදගත්කම හා ඒවාට හානි සිදු කිරීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් බවට සමාජය දැනුවත් කිරීම.

- අනාගත පරපුර වන පාසල් සිසුන්ව දැනුවත් කිරීම ඉතා වැදගත්ය.
  - සම්මන්ත්‍රණ පැවැත්වීම
  - අත් පත්‍රිකා බෙදා දීම
  - චිත්‍ර, රචනා වැනි තරඟ සංවිධානය කිරීම
  - පුවරු ප්‍රදර්ශනය කිරීම
- බාහිර සමාජය දැනුවත් කිරීම (ජනතාව)
  - පා ගමනි සංවිධානය කිරිම
  - ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ පැවැත්වීම
  - අත් පත්‍රිකා බෙදා දීම

2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම

- පුරාවිද්‍යා ස්මාරක බොහෝමයක් අද දවස තුල ද දක්නට ඇත්තේද ඒවා ප්‍රථමයෙන්ම නිර්මාණය වූ ස්වාභාවික පරිසර පද්ධතිය තුළය.
- එම නිසා ඒවාට සිදුවිය හැකි හානි වළක්වා ගැනීමට පියවර ගත යුතුය.
    - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල වැනි ආයතන
    - ග්‍රාම නිළධාරීන්, ප්‍රාදේශීය ලේකම් වැනි නිළධාරීන්

3. විවිධ ආයතන ලෙස මෙන්ම පෞද්ගලිකවද පුරාවිද්‍යා මූලාශ්‍රයන් රැක ගැනීමට ක්‍රියා කිරීමට පුළුවන.
    - පුරාවිද්‍යා මූලාශ්‍රයට හානිවන ආකාරයේ කටයුතු වලින් වැළකී සිටීම.
    - පුරාවිද්‍යා මූලාශ්‍රයට හානි සිදුවිය හැකි අවස්ථා පිළිබඳව ඒවා රැක ගැනීමට පිහිටුවා ඇති ආයතන හෝ නිළධාරීන්ව දැනුවත් කිරීම

- මෙය පුරවැසියන් වශයෙන් අප සතු පරම යුතුකමකි.